# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2396/37 – 2024 අගෝස්තු මස 08 වැනි බ්‍රහස්පතින්දා – 2024.08.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2023/178.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ප්‍රියදර්ශනී සේනානායක මිය, අංක 61/3, බොරගොඩවත්ත, මිනුවන්ගොඩ.

සහ

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගාලු පාර, රත්මලාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිලියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, නො. 13/30 හි නීතිඥ සරත් ලියනගේ මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.


1A – G 42425 – 09 (2024/08)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2023/178.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ප්‍රියදර්ශනී සේනානායක මිය, අංක 61/3, බොරගොඩවත්ත, මිනුවන්ගොඩ.

සහ

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගාලු පාර, රත්මලාන.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවය කරන ප්‍රියදර්ශනී සේනනායක මහත්මියට 2017.06.27 දින පවත්වන ලද අභ්‍යන්තර විගණක සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත එම තනතුර හිමි ද හිමිනම් එය අහිමි වීම මඟින් ඇයට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් හා එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් හිමිවිය යුතු සහන කවරේ ද ? යන්නත් පිළිබඳව වේ.''

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජූලි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0099

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.